**උඩුදුම්බර ප්‍රාදේශීය සභාව.**

**<u>මහනුවර දිස්ත්‍රිකය</u>**

## 1. මූල්‍ය ප්‍රකාශන.

----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 30 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 16 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය.

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

--------------------

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) සභාව සතු වාහන 06 ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පරිත්‍යාග ලෙස ලැබී තිබූ ටොෂිබා වීවර් (Toshiba Wiewer) ඡායා පිටපත් යන්ත්‍රයෙහි වටිනාකම හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් මිල දී ගැනීමේ දී ලැබූ රු.11,427 ක වට්ටම් ආදායමක් සේ සළකා ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවියයුතු වර්ෂයට අදාළ රු.187,926 ක ණය වාරික මුදල ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කළයුතු වුව ද, ජංගම නොවන වගකීම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැටුප් ප්‍රතිපූර්ණ ලෙස ලැබියයුතු රු.2,706,611 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි**.**

#### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්.

-------------------------

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පිළියෙළ කළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.24,756,156 ක කර්මාන්ත ණයහිමි ශේෂය ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුළු වත්කම් හා මුළු වගකීම් (හිමිකම් ද ඇතුළුව) එම ප්‍රමාණයෙන්අසමාන වී තිබුණි. එසේම, කර්මාන්ත ණයහිමි ශේෂය ජංගම වත්කම් තුළට ඇතුළත් කළහොත්, රු.2,000 ක වටිනාකමකින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුළු වත්කම් හා වගකීම් තවදුරටත් නොසැසඳෙන වන බවක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබියයුතු ගිණුම්.**

---------------------

2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.29,093,520 ක් වූ ලැබියයුතු ගිණුම් ශේෂ 14 ක වටිනාකමින් රු.3,411,747 ක් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබුණි.

**1.3.4 ගෙවියයුතු ගිණුම්.**

-------------------------

2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.26,613,026 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂ 05 ක වටිනාකමින් රු.1,206,700 ක් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ අතර, එම ශේෂයෙන් කර්මාන්ත ණයහිමි වටිනාකම රු.762,816 ක් විය.

**1.3.5 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.**

------------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසීවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති හා රෙගුලාසී යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | |
| (i) මු.රෙ.396(ඇ) | 2013 නොවැම්බර් 25 දින නිකුත් කර තිබූ නමුත්, ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ අංක 87531 දරන රු.26,115 ක් වටිනා චෙක්පත සම්බන්ධයෙන් විගණන දිනය වූ 2015 ජූනි 30 දින වන විටත් යොමුගත රෙගුලාසී ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (i) මු.රෙ.571(2) ට | විෂයයන් 05 කට අදාළ රු.402,958 ක වසර 02 ඉක්ම වූ තැන්පත් සම්බන්ධව යොමුගත රෙගුලාසීවලට අනුව කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය.**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,380,427 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,230,230 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.2,610,657 ක පිරිහීමක් දක්නට ලැබුණි.

**2..2 ආදායම් පරිපාලනය**

----------------------

**2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය**

-----------------------------------------

ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2014.01.01ට හිඟය | වර්ෂයේ බිල් කළ ආදායම | එකතු කළ ආදායම | | 2014.01.01 ට හිඟ හිටි ශේෂයෙන් අය නොවූ ප්‍රමාණය | 2014 බිල්කළ ආදායමෙන් අය නොවූ ප්‍රමාණය | මුළු අය කලයුතු ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| | | | 2014.01.01 දිනට හිඟයෙන් එකතු කළ ආදායම | 2014 වර්ෂයේ බිල් කළ ආදායමෙන් එකතු කළ ආදායම | | | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 149,736 | 73,117 | 39,223 | 42,130 | 110,513 | 30,987 | 141,500 |
| අක්කර බදු | 178,643 | 11,906 | 580 | 654 | 178,063 | 11,252 | 189,315 |
| බලපත්‍ර ගාස්තු | -- | 596,050 | --- | 596,050 | -- | -- | -- |
| කඩ කුලී | 498,630 | 549,700 | 204,030 | 426,615 | 294,600 | 123,085 | 417,685 |
| පොළ බදු දීම | 3,104 | 158,035 | --- | 158,035 | 3,104 | --- | 3,104 |
| ජල ගාස්තු | 1,034,622 | 683,505 | 487,096 | 200,962 | 547,526 | 482,543 | 1,030,069 |
| උසාවි දඩ | 656,462 | 343,129 | 056,462 | 182,797 | -- | 160,332 | 160,332 |
| මුද්දර ගාස්තු | 1,649,066 | 1,893,050 | 1,649,066 | 113,030 | -- | 1,780,020 | 1,780,020 |
| වෙනත් | 142,300 | 1,158,558 | 17,500 | 720,366 | 124,800 | 438,192 | 562,992 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,282,413 ක හිඟ ආදායම් ශේෂයක් දක්නට ලැබුණි.

### 2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී රු.149,736 ක හිඟයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.73,117 ක් විය. වර්ෂයේ අය කිරීමේ ප්‍රතිශතය හිඟයෙන් සියයට 26 ක් හා බිල් කිරීම්වලින් සියයට 58 වී තිබීම හේතුවෙන්, 2014 දෙසැම්බර් 31 දිනට අය වියයුතු රු.141,500 ක ශේෂයක් දක්නට ලැබුණි. තව ද, අය වියයුතු මුදල සම්බන්ධයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158(1) හා 159 (1) වගන්තිවල විධිවිධාන අනුගමනය කර, 2014 අප්‍රේල් 30 දින වන විටත් හිඟ ආදායම් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 ජල ගාස්තු.

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.1,034,622 ක් හිගයක් පැවති අතර, වර්ෂය තුළ හිග ශේෂයෙන් අය කිරීම් සියයට 47 ක් වූයෙන්, දෙසැම්බර් 31 දිනට රු.1,027,465 ක හිග ශේෂයක් පැවතුණි. එම මුදලින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ශේෂවල වටිනාකම රු.547,526 ක් වී තිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.160,332 ක් හා මුද්දර ගාස්තු රු.1,780,020 ක් ලැබියයුතුව පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

(අ) ග්‍රාමීය ජල සැපයුම් හා සනීපාරක්ෂක ඒකකය විසින් ලබා දි තිබූ, CP- JW- 5891 හා CP- JW- 6859 අංක දරන යතුරු පැදි 02 ක් 2015 ජූලි 24 වන විටත් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු වාහන ගාල් කිරීම සඳහා ගරාජයක් සභාව සතුව නොපැවති අතර, සභා කාර්යාල භූමියේ හා සභා සම්මන්ත්‍රණශාලා භූමියේ විවිධ කාලගුණික බලපෑම්වලට ලක් වෙමින් අනාරක්ෂිතව සභාවේ වාහන ගාල් කර තිබුණි.

(ඇ) සභාව සතු ගොඩනැගිලි පිහිටි ඉඩම් 15 ක් ප්‍රජාශාලා පිහිටි ඉඩම් 49 ක් අම්බලම් පිහිටි ඉඩම් 12 ක් හා සුසාන භූමි පිහිටි ඉඩම් 34 කට අදාළ ඔප්පු හෝ පැවරුම් නියෝග ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ..

(අ) සභාවේ CPLH – 4778 දරන ටිපර් රථය මිණිපේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රිවරයෙකු වෙත කුළී පදනම මත ලබා දීම වෙනුවෙන් තවදුරටත් අය වියයුතු රු.35,000 ක හිඟ කුළී විගණන දිනය වූ 2015 ජූලි 24 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2004 හා 2007 යන වර්ෂයන් හී සභාවේ ට්‍රැක්ටරය හා බවුසරය කුළී පදනම මත රජයේ ආයතන 03 කට ලබා දීම වෙනුවෙන් රු.32,200 ක කුළී මුදලක් අය කර ගෙන නොතිබුණි.

(ඇ) එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි නොවූ ආයතනයක් වූ සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ පරිසර බලපත්‍ර ගාස්තු අය කිරීමේ දි අය කළ එකතුව රු.11,700 ක් එකතු කල අගය මත බදු ගිණුමක රඳවා ගෙන තිබුණි.

**3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ වාහන 09 ක් අවුරුදු 01 ට වඩා වැඩි කාලයක සිට ධාවනයේ නොයොදවා නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව ගාල් කර තිබුණි.

(ආ) රු.4,542,575 ක් වටිනා රථ වාහන 07 ක් සහ වටිනාකම හඳුනා ගෙන නොතිබූ රථ වාහනයක් වර්ෂයකට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) 2014 වර්ෂයේ දි මධ්‍යම පළාත් සභාවේ, පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ලබා දි තිබූ රු.281,980 ක් වටිනා කාර්යාල උපකරණ විෂයයන් 04 කට අදාළව ඒකක 27 ක් විගණිත දින වූ 2015 ජූලි 24 වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**4.1 සංයුක්ත සැලැස්ම**

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ **සංයුක්ත සැලැස්මක්** පිළියෙළ කර නොතිබුණි.

**4.2 ප්‍රසම්පාදන සැළැස්ම.**

**-------------------------**

සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි, රු.11,826,925 ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණු නමුත්, ඒ සදහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 ක්‍රියාකාරී සැළැස්ම.**

**----------------------**

සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබීම හේතුවෙන්, කාර්තුමය ප්‍රගති සමාලෝචනයක් සිදු කළ බවට වාර්තා ද විගණනයට ඉදිරිපත් නොවුණි**.**

**4.4 විගණන හා කළමනාකරණ කමිටු.**

**------------------------------------**

සභාවේ සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් පත් කිරීමට හා රැස්වීම් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

**4.5 අභ්‍යන්තර විගණනය.**

**-----------------------**

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**4.6 අයවැය පාලනය.**

**--------------------**

සමාලෝචිත වර්ෂය සදහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසදීමේ දි ආදායම් විෂයයන් 04 ක සියයට 12 සිට සියයට 62 දක්වා ද, වියදම් විෂයයන් 06ක සියයට 18 සිට සියයට 96 ක් දක්වා ද විචලනයක් නිරීක්ෂණය වු බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලනය**

**--------------------**

පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය **කරනු ලැබේ.**

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය